සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	6 ශ්‍රේණිය	ඉතිහාසය I, II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I පත්‍රය

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස් තැන මත ලියන්න.

1) පැරණි භාණ්ඩ, ගොඩනැගිලි සහ සුන්බුන් ..... ලෙස හඳුන්වයි.
(පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය / සාහිත්‍යමය මූලාශ්‍රය)

2) ක්‍රිස්තු වර්ෂ ආරම්භ වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ .....
(උත්පත්තිය සිදුවීමට පෙර / උත්පත්තියෙන් පසු) වයි.

3) ප්‍රථමයෙන්ම ගොඩබිම ශාක පැතිර ගිය යුගය ..... ලෙස හඳුන්වයි.
(පැලියොසොයික / සිලුරියන්)

4) ගල්වලින් තැනූ මෙවලම් භාවිත කළේ ..... මානවයා විසිනි.
(හෝමෝ ඉරෙක්ටස් / හෝමෝ හැබිලස්)

5) මිනිසුන් පළමුවරට ආගමික කටයුතුවලට නැඹුරු වූයේ .....දී ය.
(මධ්‍ය ශිලා / නවශිලා)

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (√)ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

6) මිනිසාගේ සංස්කෘතික දියුණුව ප්‍රධාන අවධි තුනකට බෙදනු ලැබේ. ( )

7) කඩදාසි සහ මුද්‍රණ යන්ත්‍රය ලෝකයට හඳුන්වා දෙන ලද්දේ මායා ශිෂ්ටාචාරය විසිනි. ( )

8) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටියේ යුප්‍රටීස් සහ නයිල් ගංගා නිම්නවල ය. ( )

9) පොළොවට අධිපති දෙවියා එන්කිකි නම් වේ. ( )

10) මොහෙන්ජොදාරෝ සහ හරප්පා ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර දෙකකි. ( )

Past Papers Wiki

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

11) ඊජිප්තුවේ පිරමීඩ ඉදිකර ඇති නගරය කුමක්ද?

(1) ධොලවීර (2) කයිරෝ (3) හරප්පා (4) උර්

12) විජය ඇතුළු පිරිවර ගොඩබට ස්ථානය හැඳින්වෙන නම කුමක්ද?

(1) ලංකාපුරය (2) සිරිසවත්ථු (3) තම්බපණ්ණි (4) අනුරාධගාම

13) ගල් යුගයේ සුසාන චාරිත්‍ර සඳහා භාවිත කළ පාෂාණ විශේෂය වූයේ,

(1) කහද ය. (2) තිරිවාණ ය. (3) කළුගල් ය. (4) රතුගුරුගල් ය.

14) පණ්ඩුකාභය රජු විසින් ඉදි කරන ලද අභය වැව වර්තමානයේ හැඳින්වෙන නම කුමක්ද?

(1) බසවක්කුලම වැව (2) යෝධ වැව (3) තිසා වැව (4) නාච්චදූව වැව

15) මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ කණ්ඩායම මෙරටට වැඩම කරන ලද්දේ කුමන පාලකයාගේ රාජ්‍ය සමයකදී ද?

(1) පණ්ඩුකාභය (2) දුටුගැමුණු (3) දේවානම්පියතිස්ස (4) විජය

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

16) කාවන්තිස්ස රජතුමා ඇතුළු රජ පවුල ජීවත් වූයේ ..... රාජධානියේ ය.

17) දුටුගැමුණු රජතුමා විසින් පරාජයට පත් කළ සොළී රජු වන්නේ ..... ය.

18) වලගම්බා රජ සමයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ මාතලේ ..... දී ය.

19) වසභ රජතුමා අයත් වන්නේ ..... රාජ වංශයට ය.

20) මින්නේරිය වැව ඇතුළු මහ වැව් රාශියක් ඉදි කළ නිසා ..... රජු මින්නේරි දෙවියන් ලෙස ද හැඳින්වේ.

Past Papers Wiki

II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- තෝරාගත් තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

1) (අ) A රූපය



(i) A රූපයේ දැක්වෙන උපකරණය කුමක්ද?

(ii) එය අයත් යුගය කුමක්ද?

(iii) එය නිපදවා ඇති අමුද්‍රව්‍ය නම් කරන්න.

(iv) මෙම උපකරණය භාවිත කරන්නේ කුමන කාර්යයකට ද?

(ආ) B රූපය



(i) B රූපයෙන් දැක්වෙන උපකරණය කුමක්ද?

(ii) මෙය අයත් ශිෂ්ටාචාරය නම් කරන්න.

(iii) මේවා භාවිත කළ රාජ වංශය නම් කරන්න.

(iv) මේවායේ විශේෂත්වය කුමක්ද? (ල. 08)

2) (i) ඉතිහාසය හැදෑරීමට ප්‍රයෝජනවත් වන මූලාශ්‍රය වර්ග දෙක නම් කරන්න. (ල. 02)

(ii) පහත මූලාශ්‍රයවල කර්තෘන් නම් කරන්න.

a). මහාවංශය

b). පොළොන්නරුවේ ගල් විහාරය (ල. 04)

(iii) අ).ඉතිහාස කාල මැනීමට භාවිතා වන පහත ක්‍රම ඇතිවීමට බලපෑ සිදුවීම විස්තර කරන්න.

a). බුද්ධ වර්ෂ

b). ශක වර්ෂ

c). හිජ්රි වර්ෂ (ල. 03)

ආ).පහත දැක්වෙන සිදුවීම්වලට අදාළ වර්ෂ බුද්ධ වර්ෂ ක්‍රමයට අනුව ලියා දක්වන්න.

a). ශ්‍රී ලංකාවට නිදහස ලැබීම - ක්‍රි.ව. 1948

b). ක්‍රි.ව. 2025 (ල. 02)

3) (i) පහත නම් කර ඇති මානවයන්ගේ විශේෂ හැකියා විස්තර කරන්න.

a). හෝමෝ ඉරෙක්ටස්

b). හෝමෝ නියැන්ඩතාලන්සිස් (ල. 02)

(iii) පහත A, B, Cහා D රූපවල දක්වා ඇති විවිධ මුහුණු ඇති මානවයින් නම් කරන්න.



A



B



C



D (ල. 04)

(iii) අ). මධ්‍ය ශිලා යුගයේ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

ආ). නව ශිලා යුගයේ ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 03)

4) (i) මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටා ඇත්තේ කුමන ගංගා නිම්නවලද? (ල. 02)

(ii) මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ ජන සමාජයට අයත් කොටස් දෙකක් නම් කරන්න. (ල. 04)

(iii) අ). ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් ජනතාව භාවිත කළ ලෝහ වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

ආ). පහත A, B, C රූප හඳුනාගෙන නම් කරන්න.



A



B



C (ල. 03)

5) (i) ඉන්දියාවේ සිට ලංකාවට පැමිණි විජය කුමරු ඇතුළු කණ්ඩායම අයත් වන ජන කොටස නම් කරන්න. (ල. 02)

(ii) ගල් යුගයේ ජනතාව භාවිතයට ගත් ආහාර වර්ග හතරක් නම් කරන්න. (ල. 04)

(iii)අ). විජය කුමරු මෙරටට පැමිණෙන විට මෙරට සිටි ගෝත්‍ර තුනක් නම් කරන්න. (ල. 03)

ආ). විජය කුමරු විවාහ කරගත් ගෝත්‍රික කාන්තාව නම් කරන්න. (ල. 01)

ඉ). එම කාන්තාව විජය කුමරු හමුවන අවස්ථාවේ නිරතව සිටි කාර්යය කුමක්ද? (ල. 01)

6) (i) මෙරට පැවිදි වූ ප්‍රථම කාන්තාව හා පුරුෂයා නම් කරන්න. (ල. 02)

(ii) දුටුගැමුණු රජුගේ සේනාපතිවරු දසදෙනා අතරින් හතර දෙනකු නම් කරන්න. (ල. 02)

(iii) අ). පහත රජවරු ඉදිකළ දාගැබ් නම් කරන්න.

a). වලගම්බා

b). දුටුගැමුණු (ල. 02)

ආ). පහත වැව් ඉදිකළ රජවරු නම් කරන්න.

a). මහා විලච්චිය වැව

b). හුරුළු වැව

c). කලා වැව (ල. 03)

7) (i) පණ්ඩුකාභය රජතුමාගේ මව සහ පියා නම් කරන්න. (ල. 02)

(ii) දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයේ සිදුවූ වැදගත් සිදුවීම් දෙකක් නම් කරන්න. (ල. 04)

(iii) අ). දුටුගැමුණු රජතුමාගේ මව හා පියා නම් කරන්න. (ල. 02)

ආ). පහත සිදුවීම් සිදුවූ රාජ්‍ය කාලය වරහන් තුළින් තෝරා ලියන්න.

a). බැමිණිතියා සාගතය

b). උමං ජල මාතිකා ක්‍රමය

c). පණ්ඩු, පාරින්ද, බුද්ධ පාරින්ද ඇතුළු දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් පැමිණීම.

(පණ්ඩුකාභය, මහසෙන්, වළගම්බා, ධාතුසේන, වසභ) (ල. 03)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank